# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2159/47 - 2020 ජනවාරි මස 24 වැනි සිකුරාදා - 2020.01.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 (1) වැනි ව්‍යවස්ථාවට හා 46(1)(අ) වැනි ව්‍යවස්ථාවට අනුකූලව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, ම විසින් 2019 දෙසැම්බර් මස 10 වැනි දිනැති අංක 2153/12 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළකරන ලදුව, අංක 2159/15 හා 2020 ජනවාරි මස 22 දිනැති *ගැසට් නිවේදනයෙන්* සංශෝධිත එකී උපලේඛනය, වහාම ක්‍රියාත්මකවන පරිදි තවදුරටත් පහත උපලේඛනයේ සඳහන් ලෙස සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගෝඨාභය රාජපක්ෂ,
ජනාධිපති.

2020 ජනවාරි මස 24 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලය.

#### උපලේඛනය

(1) එම නිවේදනයෙහි අංක (1) "ආරක්ෂක අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි 26 සහ 27 අයිතමයන් ඉවත් කිරීමෙන් ;
(ආ) එහි I වැනි තීරුවෙහි අයිතම 25 සිට නැවත අංක ගත කිරීමෙන් ;
(ඇ) එහි II වැනි තීරුවෙහි 20 අයිතමය ඉවත් කිරීමෙන් ;
(ඈ) එහි II වැනි තීරුවෙහි අයිතම 19 සිට නැවත අංක ගත කිරීමෙන් ;
(ඉ) එහි III වැනි තීරුවෙහි පහත සඳහන් අයිතමයන් ඉවත් කිරීමෙන් ;

- ආගාමික හා විගාමික පනත (1948 අංක 20)
- පුරවැසි පනත (1948 අංක 18)
- ඉන්දීය සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (2003 අංක 35)
- අදේශික තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (1986 අංක 5)
- අදේශිකයින්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත (1988 අංක 39)

02-159


1A - G 31878 — 382 (2020/01)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*